දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය - Faculty of Humanities & Social Sciences

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2018 පරීක්ෂණය (2015 පුනර්) - 2018 සැප්තැම්බර්/ඔක්තෝබර්
First Examination in Arts (External) 2018 (Repeat 2015) – September/October 2018

සිංප්‍ර 1.2 - සාහිත්‍ය පරිචය
SL 1.2 – Competence of Literature

කාලය පැය තුන යි

පළමු වන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩුවිය හැකි ය

---

01. (අ) සහ (ආ) කොටස්වල තද කළු අකුරින් මුද්‍රිත පද සියල්ලෙහි ම තේරුම් සහිතව ඒවා වත්මන් ලිඛිත සිංහලයට නගන්න.

(අ) බොහෝ දෙනා ළගන්වා යුක්තිය පසිඳිනා බව සුදුසු යැ යි පළමු කොට සොරු කැඳවාලා, 'තෝ මේ ගොන් ගෙය කුමක් කවා පොවා වැඩී ද' යි විචාළ සේක. සොරා කියන්නේ, 'උළුකැන් පොවා තලමුරුවට හා උඳු කවන ලද' යි කී ය. ඉක්බිත්තෙන් ගොන් ඇති තැනැත්තවු කැඳවා, 'තෝ කුමක් කවා පොවා වැඩී ද'යි විචාළ කල්හි, ඒ කියන්නේ, 'ස්වාමීනි, මා දුක්පත් තැනැත්තවුට උළුකැන් හා තල ආදිය කොයින් ද? තණ ම කවන ලද'යි කී ය. පණ්ඩිතයන් වහන්සේ දෙන්නා ගේ බස් අසා සභායෙහි උන්නවුන් ගිවිස්වා පුවඟු කොළ ගෙන්වා ගෙන, වනෙහි කොටා පැන් මඬවා, ගොන් ගෙන්වා පෙවූ සේක. ගොන් තණ ම නැගුහ. පණ්ඩිතයන් වහන්සේ බොහෝ දෙනාට, 'මේ බලව' යි පෑ 'සොරෙහි ද, නොසොරෙහි ද'යි සොරු විචාළ සේක. ඒ තෙමේ, 'සොරෙමි' කී ය. 'එසේ වී නම් මේ තැන් පටන් සොරකම් නො කරව' යි අවවාද කොට, 'මෙ බඳු නොකටයුත්තක් නො කරව' යි වදාළ සේක. බෝධි සත්ත්වයන් වහන්සේ ගේ පුරුෂයෝ වනාහි, ඔහු එතැනින් පිටි පස්සට ගෙන, අතින් පයින් තළා දුර්වල කළහ. ඉක්බිති පණ්ඩිතයන් වහන්සේ ඔහු ගෙන්වා, 'මේ ජන්මයෙහි ම මේ සා දුකකට පැමිණියෙහි ය: පරලොව වනාහි නරකාදියෙහි ඉපිද බොහෝ දුක් අනුභව කරන්නෙහි ය, මෙ තැන පටන් සොරකම් නො කරව' යි අවවාද කොට පන්සිල් දුන්හ. අමාත්‍යයා, එ පවත් අසා තත්ත්වය පෙර පරිද්දෙන් රජ්ජුරුවනට කියා යැවී ය. රජ්ජුරුවෝ සේනකයන් විචාරා 'දේවයෙනි, ගොන් යුක්ති නම් යම් කිසි කෙනෙක් පසිඳ පියති. තව ද ඇම්මුන මැනැවැ' යි කී කල්හි මධ්‍යස්ථ ව නැවත පෙර පරිද්දෙන් අමාත්‍යයාට කියා යැවූහ. අමාත්‍යයා, රජ්ජුරුවනට කියා යවන නියාව ද, රජ්ජුරුවන් සේනකයන් විචාරන නියාව ද, සේනකයන් වළකන නියාව ද, රජ්ජුරුවන් අමාත්‍යයාට කියා යවන නියාව ද හැම පැනයෙහි ම මෙ ම ලෙස යැ යි දත යුතුයි.

උම්මග්ග ජාතකය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2015

(ලකුණු 07)

(ආ) කලා සපිරි සිසි වත මන කලාවන්
නිලා තිබෙන බැම ඉඳු දුනු පිලා වන්
දුලා තනන තන රන හස පිලා වන්
බලැ පියැ’ද යනු බැරි පුර කලාවන්

(ලකුණු 07)

එනසඳ පෙර මෙ පුර කිරි සිඳු දුව තුටු ව
සිඳු රද විසින් ඇය රැකවරණට කැටු ව
පිරිසඳ එවූ සිඳු කඬකෙව් නොව පටු ව
ඇම සඳ පිරුණු දිය’ගල ලොබ වෙයි දුටු ව

(ලකුණු 07)

(ඇ) පහත දක්වෙන කාව්‍ය නිර්මාණයෙහි වාච්‍යාර්ථ ඉක්මවා ධ්වනිතාර්ථ ජනිත වන ආකාරය නිදසුන් සපයමින් විවරණය කරන්න.

### වරම් ලැබීම

උර දරු මගෙ බරින් දිවි මඟ වී ද පමා
කුල ගෙට පිය නගම් වරදට වනුය කමා
පාද පද්ම වැඳ මල් බර සිරස නමා
අවසර පතන්නෙමි ගුණ සරු සොයුරු තුමා

එකලා ලිය ගමන පිරිපත දක නපුරු
මගෙ තනි මැකෙන සේයාවක් පෙනෙන තුරු
දක දක පලා යන සැටි අවර ගිර හිරු
පෙර කුල සිරිත් වැල ගෙල ලා සිටි සොයුරු

කටුසර අහර දළ රෙදි පුදා සිරුරට
කළ මහ පිනෙන් මට දායාද සරි කොට
දිවි බඳුනෙන් සැලුණු අම යළිදු ලබනට
සොහොයුර බලග, ආසිරි වසර සියයෙක

දක නර කෙස් අසුබ පෙර ලකුණු නො හඟින
ඉසුරු භව භෝග නො ව හද ම හඳුනන
කුමර පෙරහැරට නිසු සුතන් වඩවන
යෙහෙකි කැඳවනුව ඔබෙ සිහින වරඟන

ගිලන් මව් සුසුම් වැල් රැඳුණු මහ ගෙට
නැවුම් සුළං සලසා පිළිසකර කොට
කුටුම්භය ළකල් තිරසරව සදනට
ඉදින් වරම් දෙමි කරකාර බඳිනට

(ලකුණු 07)

02. උම්මග්ග ජාතකයෙහි කතා රසය ගොඩනැඟීමට කතුවරයා භාවිත කළ රචනෝපක්‍රම සනිදර්ශන ව විමර්ශනය කරන්න.

03. "කාව්‍ය ශෝභාවත් කරන ධර්මයෝ අලංකාර වෙති." මේ කියමන ගිරා සන්දේශ කතුවරයාගේ අංලකාර භාවිතය ඇසුරෙන් පහදන්න.

04. ගිහි ජීවිතය හැර යන මොහොතෙහි සිදුහත් කුමරුන්ගේ සිතෙහි ජනිත වන සංකීර්ණ මනෝභාව නිරූපණයෙහි ලා කවියා දක්වා ඇති ප්‍රතිභාව යසෝදරාවත ඇසුරෙන් නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

05. 'භාෂාව, රංගනයේ අර්ථ ප්‍රතීතය තීව්‍ර කිරීමෙහි ලා මනා ලෙස උපයෝගි කර ගැනීම මනමේ නාටකයේ එක් විශේෂත්වයකි' අවස්ථා තුනක් වත් ඇසුරෙන් මේ ප්‍රකාශයෙහි සත්‍යාසත්‍යතාව පැහැදිලි කරන්න.

06. ප්‍රබල සමාජ දේශපාලන ව්‍යාපාරයක අවනතිය ලාංකික සමාජය කෙරෙහි ඇති කරන ලද බලපෑම ප්‍රේමයේ සත්‍ය කතාව කෘතියෙහි කවරාකාරයෙන් නිරූපිත ද යන්න චරිත හා අවස්ථා පාදක කර ගනිමින් පැහැදිලි කරන්න.

(02 සිට 06 දක්වා ලකුණු 18 බැගින්)

ශශශශශශශශශශශශශශශශශශශශශශශශශශශශශශ